විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය
எனது இலக்கம்
My Number } UGC/HR/10/01

තැපැල් පෙට්ටිය
அஞ்சல் பெட்டி
Post Office Box } 1406

ඔබේ අංකය
உமது இலக்கம்
Your Number }

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
௨௦, வாட்டு இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.

18.08.2023

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**Filling of vacancies for the Academic Staff posts in the Higher Educational Institutions/Institutes**

This is with reference to the Cabinet Decision dated 07.08.2023 made on Cabinet Paper No. 23/1195/607/102 on filling of vacancies for the Academic Staff posts in the Higher Educational Institutions/Institutes.

Please be informed that the Cabinet of Ministers has granted approval in principle to recruit academic staff for the vacancies created due to the reasons such as retirement, resignation and vacation of post during the years 2022 and 2023, subject to managing the same within the already allocated budget for the year 2023 at your institution.

However, it has been further informed that information pertaining to the number of vacancies created due to the reasons such as retirement, resignation and vacation of post of the academic staff during the years 2022 and 2023, and the financial requirements to fill such vacancies should be submitted to the Department of Management Services in order obtain their concurrence prior to making such recruitments.

Therefore, you are hereby kindly informed to furnish the detailed report of the above mentioned information of your institution to the Department of Management Services for its approval with a copy to the UGC and make necessary arrangements to fill the relevant academic vacancies.

Your early attention in this regard is highly appreciated.

**Senior Prof. Sampath Amaratunge**
Chairman

දුරකථනය
தொலைபேசி
Telephone } 2695301 2695302 2692357

ෆැක්ස්
பெக்ஸ்
Fax } 2688045

වෙබ් අඩවිය
வெப் தளம்
Website } http://www.ugc.ac.lk

රහසිගතයි

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION අමාත්‍ය මණ්ඩල තීරණය அமைச்சரவைத் தீர்மானம்

My No : CP/DEC/23
Date : 2023-08-16

Secretary
Ministry of Education

**CABINET DECISIONS - 2023-08-07**

Five (05) decisions in respect of under mentioned reference numbers made at the Cabinet Meeting held on 2023-08-07 are sent herewith.

W.M.D.J. Fernando
Secretary to the Cabinet of Ministers

| | | |
|---|---|---|
| 23/1433/604/141 | 23/1195/607/102 | 23/1328/607/108 |
| 23/1336/607/109 | 23/1365/607/112 | |

7

Prepared by:

Checked by :

(1)

රහසිගතයි

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION | අමාත්‍ය මණ්ඩල තීරණය | அமைச்சரவைத் தீர்மானம்

මගේ අංකය: අමප/23/1195/607/102 2023 අගෝස්තු මස 15 දින.

**පිටපත්:**

ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.
විගණකාධිපති.

**ක්‍රියා කළ යුතු:**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.
අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව.
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

**විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල පවතින**
**<u>අධ්‍යයන කනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම</u>**

(අධ්‍යාපන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2023-06-23 දිනැති සංදේශය)

2023 අගෝස්තු මස 07 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

30. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1429/640/027 වශයෙන් අංකගත කෙරුණු, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය සහ ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සභාපතිතුමා ඉදිරිපත් කළ 2023-08-03 දිනැති සටහනට යා කොට තිබූ, 2023-08-02 දින පැවැත්වුණු ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශ ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදී.

(2)



**එකී වාර්තාවේ ඇතුළත් ඔබ අමාත්‍යාංශයට අදාළ පහත සඳහන් නිර්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:**

"30.02 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1195/607/102 වූ, **"විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල පවතින අධ්‍යයන තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම"** යන මැයෙන් අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කළ 2023-06-23 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය, පහත සඳහන් කරුණු සමඟ මෙම රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් සලකා බලන ලදී:

(I) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ 2023-08-02 දිනැති නිරීක්ෂණ;

(II) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාගේ 2023-08-02 දිනැති නිරීක්ෂණ; සහ

(III) විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කටයුතු කාර්යක්ෂමව හා වඩාත් ඵලදායීව පවත්වාගෙන යාම සඳහා, 2022 සහ 2023 වසරවල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් විශ්‍රාම ගැනීම, සේවය අතහැර යාම සහ ඉල්ලා අස්වීම යන කරුණු මත ඇති වී තිබෙන තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් අධ්‍යාපන ඇමතිතුමා විසින් සිදු කරන ලද වැඩිදුර කරුණු පැහැදිලි කිරීම.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට තීරණය කරන ලදී:

(i) 2023 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන සීමාවන් තුළ කළමනාකරණය කර ගැනීමට යටත්ව, 2022 සහ 2023 වසරවල රාජ්‍ය

→ 3

විශ්වවිද්‍යාල සහ ඒවාට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් විශ්‍රාම ගැනීම, සේවය අතහැර යාම සහ ඉල්ලා අස්වීම යන කරුණු හේතුවෙන් ඇති වී තිබෙන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දීම; සහ

(ii) ඉහත (i) හි සඳහන් පරිදි හඳුනාගනු ලබන තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව සහ එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර, එම දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව අදාළ බඳවාගැනීම් සිදු කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නියම කරන මෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් දීම."

ක්‍රියා කළ යුතු: **මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
**සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

පිටපත් : **ජනාධිපති ලේකම්** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
**අග්‍රාමාත්‍ය ලේකම්** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**